# තෙත් කලාපීය මූල ඓතිහාසික ජනාවාසකරණය පිළිබඳ ජනප්‍රවාද ඇසුරින් පරීක්ෂා කිරීම

එච්.ඒ.එස්.එන්.හංචාපොල , එන්.ඒ.ඩී.එම්.නිස්සංක*

තෙත් කලාපීය මූල ඓතිහාසික ජනාවාසකරණය පිළිබඳ පුරාවිද්‍යා සාධක ප්‍රමාණවත් තරම් නොමැති වුව ද මූල ඓතිහාසික ජනාවාසකරණය පිළිබඳ තෙත් කලාපීය ප්‍රදේශවල ජනප්‍රවාද රැසක් පවතී.එම ජනප්‍රවාද ඇසුරු කර ගනිමින් ජනාවාසකරණය පිළිබඳ තොරතුරු සොයා බැලීමට අරමුණ වේ. මෙම පර්යේෂණය සඳහා පුරාවිද්‍යා සාධක වන මූල ඓතිහාසික මැටි ඔරු සුසාන පිහිටි ප්‍රදේශ පරීක්ෂා කර එම ප්‍රදේශවල ජනයාගෙන් ලබා ගන්නා ලද ජනප්‍රවාද , විශ්වාස ආදිය රැස් කිරීමත් , වාර්තා පරිශීලනයත් , තොරතුරු පරීක්ෂා කිරීමත් සිදු කරන ලදී.

ලක්දිව ජනාවාසකරණය වූ ආකාරය පිළිබඳ පර්යේෂණ පවත්වන්නෙකුට ප්‍රාග් ඓතිහාසික, මූල ඓතිහාසික , ඓතිහාසික යන අවධීන් ත්‍රිත්වෙයහිම ජනාවාසකරණයට අදාල පුරාවිද්‍යා සාධක ලංකාවේ විවිධ ප්‍රදේශවලින් හමු වේ. මෙම පර්යේෂණයට පාදක වන ලංකාවේ මූල ඓතිහාසික යුගයෙහි ජනාවාසකරණය පිළිබඳ පර්යේෂණයන්ට බොහොමයක් සාධක හමු වී ඇත්තේ සුසාන ආශ්‍රයෙනි. ඓතිහාසික තොරතුරු හමු වී නොමැති ලංකාව තුලින් හඳුනාගෙන ඇති මූල ඓතිහාසික යුගයෙහි සුසාන වර්ග දෙකකි.එනම් වියළි කලාපයේ පිහිටා ඇති ග්‍රැනයිට් අමුද්‍රව්‍ය කර ගත් සුසාන සහ තෙත් කලාපයේ පිහිටි මැටි ඔරු සුසානයි. තෙත් කලාපීය මැටි ඔරු සුසාන දැනට අනාවරණය කරගෙන ඇත්තේ කළෝටුවාව , නිකවලමුල්ල , මාකෙවිට , දෙවලපොළ යන ප්‍රදේශවලිනි. මෙම සුසානවලින් මූල ඓතිහාසික යුගයෙහි මානවයා සිය අවමංගල්‍යන් කුමනාකාරයේ අභිචාරයන්ට අනුව සිදු කරන්නට ඇති ද යන්න පිළිබඳව සාධක රැසක් අනාවරණය කර ගෙන ඇත. ජනප්‍රවාදයන්ට අනුව මාකෙවිට ප්‍රදේශයේ යක්කඩුවත් , කළෝටුවාව හා නිකවලමුල්ල ප්‍රදේශයේ යක්කලත් , දෙවලපොළ ප්‍රදේශයේ යකහටුව වැනි 'යක්' නාමයන්ගෙන් යුතු ගම්මාන පිහිටීම අහම්බයෙන් සිදුවිය නොහැකිය.මෙම ගම්මාන නාමයන් සමග ලක්දිව විසූ සේ පැවසෙන යක්ෂ ගෝත්‍රිකයන් හා සම්බන්ධ ජනප්‍රවාද බැඳී පවතී. මෙවන් පසුබිමක් පවතින තෙත් කලාපීය ප්‍රදේශයන්හි ජනාවාසකරණය පිළිබඳ පර්යේෂණ කරන්නෙකුට ජනප්‍රවාද , පැරණි විශ්වාස පූර්ණ වශයෙන් අසත්‍ය සේ සළකා බැහැර කළ නොහැකි වේ.එබැවින් තෙත් කලාපීය ප්‍රදෙශයන්හි ජනාවාසකරණය පිළිබඳ පර්යේෂණ කරන්නෙකු මෙම ජනප්‍රවාද , පැරණි විශ්වාස කෙරෙහි සංවේදී වෙමින් සිය පර්යේෂණය කිරීම වඩා උචිත බව පැවසිය හැකිය.

මුඛ්‍ය පද : ජනප්‍රවාද , ජනාවාසකරණය , මූල ඓතිහාසික යුගය , තෙත් කලාපය , මැටි ඔරු සුසාන

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය , කැලණිය විශ්වවිද්‍යාලය ,කැලණිය disninissaka@gmail.com /sandunihanchapola@gmail.com